// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1788/40 - 2012 දෙසැම්බර් මස 14 වැනි සිකුරාදා - 2012.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොටගෙන දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ප්‍රියන්ත උදය කුමාර නම් වූ සභිකයා අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ , ඒ පක්ෂයට අයත් ඒ දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන මහතන්තිලගේ රවින්ද්‍ර ලක්මාල් සමරරත්න මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මහතන්තිලගේ රවින්ද්‍ර ලක්මාල් සමරරත්න මහතා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම්භාර නිලධාරි,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

2012 දෙසැම්බර් මස 11 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

12-908

1A - G 17026— 350 (2012/12)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.